## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ පරිවාස නිලධාරී II වන ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීම - 2023

එම තනතුර සඳහා ඔබට ඇති සුදුසුකම් පරීක්ෂා කර බැලීමේ සම්මුඛ පරීක්ෂණය 2024.06.03 වන දින පෙ.ව.11.00 ට අංක 628, 10 වන මහල, ජන ජය සිටි ගොඩනැගිල්ල, නාවල පාර, රාජගිරිය යන ලිපිනයේපිහිටි බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදී පැවැත්වීමට කටයුතු යොදා ඇත. එදිනට පහත සඳහන් සහතික සහ ඒවායේ සහතික කරන ලද ඡායා පිටපත්ද රැගෙන මෙම කාර්යාලයට පැමිණෙන ලෙස මින් දන්වා සිටිමි.

1. උප්පැන්න සහතිකය (ඔබ භාවිතා කරන නමේ සහ උප්පැන්න සහතිකයේ සඳහන් නාමෙහි කිසියම් වෙනසක් ඇති නම් එම වෙනස පැහැදිලි කිරීම දිව්රුම් ප්‍රකාශයක් ඉදිරිපත් කල යුතුය.)

2. ජාතික හැඳුනුම්පත හෝ වෙනත් වලංගු හැඳුනුම්පතක්.

3. බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවීමේ නිවේදනය අනුව අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වන උපාධි සහතිකයන්හි මුල් පිටපත සහ එහි සවිස්තරාත්මක ප්‍රතිඵල සහතිකය(Detailed Certificate)

4. අ.පො.ස (සා.පෙළ) ප්‍රතිඵල සහතිකය හා අ.පො.ස (උ.පෙළ) ප්‍රතිඵල සහතිකය (විභාග දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද)

5. දැනට දරණ ස්ථිර තනතුරේ පත්වීම් ලිපිය හා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය (සීමිත අයදුම්කරුවන් සඳහා පමණි)

6. පරිවාස නිලධාරී II ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ දැන්වීමට අනුව පරිවාස නිලධාරී තනතුරට අදාල සුදුසුකම් සනාථ කිරීම සඳහා උපයෝගී කරගත් සහතික සහ අයදුම්පත පිරවීමේදී උපයෝගී කරගත් අනෙකුත් සියළුම සහතික

තවද මෙම සම්මුඛ පරීක්ෂණයට පැමිණීම වෙනුවෙන් ගමන් වියදම් හෝ වෙනත් කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණයට කැඳවීම උක්ත තනතුරට පත්කිරීමට ඇති හිමිකමක් නොවන බවද කාරුණිකව දන්වමි.

තිලක් සෙනරත්,<br>
ලේකම්,<br>
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,<br>
බස්නාහිර පළාත.